සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

46 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් :

* I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

1. වේද යුගයේ හින්දු ශිෂ්ටාචාරයෙහි විශේෂතා පහත සඳහන් මාතෘකා ඇසුරෙන් පහදන්න.

   (අ) වේද ග්‍රන්ථවල ව්‍යුහය

   (ආ) ඍග් වේදයේ සඳහන්වන ප්‍රධාන දෙවිවරු

   (ඉ) ආගමික වන්දනාව

   (ඊ) වේද යුගයේ සමාජය

   (ලකුණු 5 × 4 = 20යි)

2. (අ) චෝල යුගයේ දේවාල ගෘහ නිර්මාණ කලාවේ වර්ධනයට දායක වූ චෝල රජවරුන් **තිදෙනෙකුගේ** නම් සඳහන් කරන්න. (ලකුණු 03යි)

   (ආ) චෝල යුගයේ දේවාල ගෘහ නිර්මාණ කලාව වර්ධනය වූ ආකාරය පහත සඳහන් මාතෘකා යටතේ පැහැදිලි කරන්න.

   (i) ප්‍රාග් යුගයේ චෝල දේවාල (ලකුණු 05යි)

   (ii) මධ්‍ය කාලීන චෝල දේවාල (ලකුණු 06යි)

   (iii) පසු කාලීන චෝල දේවාල (ලකුණු 06යි)

3. "හින්දු ආගමික සමාජ පුනරුදයේ, රාමක්‍රිෂ්ණ මඩමෙහි දායකත්වය සහ සේවාව සුවිශේෂීය." මෙම ප්‍රකාශයේ යෝග්‍යතාවය පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් විස්තර කරන්න.

   (අ) ශ්‍රී රාමක්‍රිෂ්ණර්ගේ දේශනා

   (ආ) ස්වාමි විවේකානන්දර් සහ රාමක්‍රිෂ්ණ මඩම

   (ඉ) මඩමේ ආගමික සේවා

   (ඊ) මඩමේ සමාජ සේවා

   (ලකුණු 5 × 4 = 20යි)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස

4. සංකරර්ගේ අද්වෛද වේදාන්තයේ ප්‍රධාන අංග සහ ආත්ම විමුක්තියට අදාළ ක්‍රම මාර්ගය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 20යි)

5. ශෛව සිද්ධාන්ත දෘෂ්ටි කෝණයේ පදිගේ පැවැත්ම, පදිගේ ගතිලක්ෂණ පිළිබඳ අදහස් විස්තර කරන්න. (ලකුණු 20යි)

6. ශ්‍රී ලංකාවේ තිරුකේදීශ්වරම් දේවාලයේ ප්‍රධාන දෙවියන් (මූර්ති), දේවාල (තල) සහ තීර්තම්හි විශේෂතා පහදන්න. (ලකුණු 20යි)

7. මහජනතාවගේ පරිපූර්ණ ජීවිතයට තිරුක්කුරල් ග්‍රන්ථය ලබා දෙන යහපත් උපදෙස් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 20යි)

8. ශිව දෙවියන්ගේ නඩරාජ ස්වරූපයේ විශේෂතා එහි ඉරියව්වලින් ප්‍රකාශ කෙරෙන ලාලිත්‍යභාවයන් සහ එම ස්වරූපය විස්තර කරන දාර්ශණික මත ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20යි)

* * *